# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2022.01.11

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

01) ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මිය - ප්‍රධාන ලේකම්

02) පී.සෝමසිරි මහතා - ආණ්ඩුකාර ලේකම්

03) තිලක් සෙනරත් මහතා - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

04) යූ.බී.ආර්.රාජපක්ෂ මහතා - සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප)

05) ඒ.ඩී.එස්.සදිකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යංශය(බ.ප)

06) එන්.නිල්වල මහතා - ලේකම්,කෘෂිකර්ම අමාත්‍යංශය(බ.ප)

07) කේ.චම්පා එන්. පෙරේරා මිය - ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යංශය(බ.ප)

08) ගාමිණී ධර්මසේන මහතා - ලේකම්,සෞඛ්‍ය අමාත්‍යංශය(බ.ප)

09) ඩබ්ලිව්.එම්.දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

10) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

11) ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)

12) ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - වැ.බ.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

13) කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

14) සමිතා පෙරේරා මිය - සහකාර ලේකම් (අධ්‍යාපන අමාත්‍යංශය)

15) පාලිත අබේවර්ධන මයා - ප්‍රධාන නීති නිලධාරී

16) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

17) පේෂලා අබේසූරිය මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | 2022 වර්ෂයේ දී කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සම්බන්ධව | පසුගිය වර්ෂ දෙකෙහි පැවති වාතාවරණය තුල අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන වෙතින් මහජනතාව වෙත කාර්යක්ෂම සේවාවක් සැපයීමට නොහැකි වූ අතර "බස්නාහිර පෙරට" දැක්ම අනුව යමින් අභ්‍යන්තර මෙන්ම බාහිර සේවාලාභීන් වෙනුවෙන් ආචාරශීලි, කාර්යක්ෂම සේවාවක් සැපයීමට කටයුතු කරන ලෙසත් , රාජකාරී කටයුතු සම්බන්ධයෙන් සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන නිවැරදිව සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් රාජකාරී කටයුතු සම්බන්ධව පසු විපරම් කිරීම හා අධීක්ෂණය කිරීමට කටයුතු කරමින් එකම කණ්ඩායමක් ලෙස කටයුතු පවත්වාගෙන යාමට 2022 වර්ෂයේදී සියලුම නිලධාරීන් කටයුතු කලයුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 02. | කණ්ඩායම් ප්‍රවාහනය සම්බන්ධව | කණ්ඩායම් ප්‍රවාහනය සම්බන්ධයෙන් මාණ්ඩලික නිලධාරීන්ගේ තොරතුරු ලබාගෙන මෙතෙක් කණ්ඩායම් ප්‍රවාහනය යොදවා තිබූ වාහන 27 ක් 13 දක්වා අඩු කිරීමට පියවර ගෙන ඇති බවත් ඒ සදහා මෙතෙක් කිසිදු විරෝධතාවක් යොමුවී නොමැති බවත් සාකච්ඡා කරන ලදී.<br>තවද මෙතෙක් කණ්ඩායම් ප්‍රවාහනය සදහා යොදවාගෙන තිබූ වාහන 27න් ඉවත් කරන ලද වාහන පිළිබඳ තොරතුරු තබා ගන්නා ලෙසත් , දැනට කණ්ඩායම් ප්‍රවාහනය සදහා යොදවන ලද වාහන 13න් එකක් හෝ ප්‍රවාහනය සදහා යොදවාගැනීමේ අපහසුතාවක් ඇතිවුවහොත් එම යොදානොගත් වාහන යොදවා ගැනීමට කටයුතු කරන බව දන්වා එම අමාත්‍යාංශ, ආයතන වලට ලිඛිතව දැනුම්දෙන ලෙසත් , ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. තවද රාජකාරී අවශ්‍යතාවය මත සීමාවක් හා පාලනයක් ඇතිව යම් නිලධාරියෙකු ප්‍රවාහන කටයුතු සදහා වාහන යොදවා ගැනීමේ ගැටළුවක් නොමැති නමුත් විධිමත් අනුමැතියකින් තොරව තමන්ගේ අවශ්‍යතාවය මත වාහන යොදා ගැනීමට කටයුතු නොකරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ,<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 03. | අභාසලාභී උපාධිධාරීන් සඳහා පත්වීම් ලබා දීම හා වැටුප් ගෙවීම | අභාසලාභී උපාධිධාරීන් සඳහා සංවර්ධන නිලධාරී පත්වීම් සංකේතාත්මකව 150ක පමණ ප්‍රමාණයකට පත්වීම් ලබා දීමට බලාපොරොත්තු වන බවත් ඉන්පසු දිස්ත්‍රික් මට්ටමින් කම්වු පත්කර ඒ මඟින් ඉතිරි පිරිසට පත්වීම් ලබා දී අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභා ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>තවද සංවර්ධන නිලධාරීන්ට පත්වීම් ලබා දීම පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡාකල අතර මෙතෙක් ඔවුන්ට පත්වීම් ලබා දී නොතිබුණු නිසා ස්ථාන මාරුවීම් සිදුනොකළ බවත් ඉදිරියේදී ස්ථාන මාරුවීම් සිදුකිරීමේ හැකියාව ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව ඔවුන්ට දැනට සේවය කරන ස්ථානවලම පත්වීම් ලබා දීමට කටයුතු කර පසුව ගැලපෙන පරිදි ස්ථාන මාරු වීම් ලබා දීම පිළිබඳ අවධානය යොමුකරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද සංවර්ධන නිලධාරී නව පත්වීම් ලබාදෙන පිරිසට වැටුප් ගෙවීමට කටයුතු කිරීම සම්බන්ධව ප්‍රධාන ලෙකම් විසින් විමසා සිටි අතර ඒ අනුව නව පත්වීම් ලබාදෙන 4271 ක් දෙනෙකු සඳහා මසකට රු. මිලියන 178ක් හා වසරකට රු.මිලියන 2141 ක මුදලක් අවශ්‍ය බවත් එම මුදල ඉල්ලා රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිඛිතවද දැනුම් දීමට කටයුතු කර ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලෙකම් (මූල්‍ය ) විසින් ප්‍රකාශ කරන ලදී. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු / මූල්‍ය) |
| 04. | අමාත්‍යාංශ වලින් 2021 වසරේදී සිදුකරනු ලැබූ ව්‍යාපෘති හා 2022 වසරේදී සිදුකිරීමට බලාපොරොත්තුවන ව්‍යාපෘති සැලසුම් සම්බන්ධව | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන හා පළාත් සංවර්ධන ප්‍රධාන මඟින් වෙන්කල ප්‍රතිපාදන සම්බන්ධයෙන් වැයකල මුදල, මූල්‍ය ප්‍රගතිය, අතැති බිල් හා වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණයන් සම්බන්ධව එක් එක් අමාත්‍යාංශ මට්ටමින් සමාලෝචනය කරන ලදී. තවද, අමාත්‍යාංශ වශයෙන් නොමැතිව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන හා පළාත් සංවර්ධන ප්‍රධාන වශයෙන් සියළුම ප්‍රතිපාදනවල මූල්‍ය ප්‍රගතිය , භෞතික ප්‍රගතිය වෙන් වශයෙන් සමස්ථ වියදම සකස්කර ලබාදෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියොජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>අමාත්‍යාංශ මට්ටමින් ලැබුණු ප්‍රතිපාදන භාවිතා කොට අමාත්‍යාංශයේ අරමුණු හා මෙහෙවර ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රියව එම මුදල් යෙදවීම හා අධීක්ෂණය කිරීම සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ අරමුණ හා වගකීම විය යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) , |

| | | | |
|---|---|---|---|
| 05. | අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතනවල කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යාමට කටයුතු කිරීම සම්බන්ධව | අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතනවල කටයුතු විධිමත් පරිදි සිදු වෙනවාද යන්න පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරු විසින් ඍජු අධීක්ෂණයක් සිදුකල යුතු බවත් , දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රාදේශීය මට්ටමින් සේවය කරන ආයතන ප්‍රධානීන් මසකට වරක් හෝ රැස්කොට එම කාර්යාලවල තත්ත්වය , ඔවුන් සිදුකරන සංවර්ධන කටයුතු ජනතා අභිලාශයන් ඉටුකිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම හා පසුවිපරම් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් , |
| 06. | පළාත් සභා සංකීර්ණයේ පවතින සියලුම ආයතන ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සම්බන්ධව | සියලුම අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු , ප්‍රධාන ලේකම් කාර්යාලය හා අනිකුත් ආයතන ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් විසින් අවධානය යොමු කරන ලද අතර ඊට අදාළව වැයවන මුදල සම්බන්ධව ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු) වෙත දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 07. | 2022 වසර සඳහා කාර්තු ක්‍රමයට ලැබෙන ප්‍රතිපාදන හා අතැති බිල්පත් පියවීම සම්බන්ධව | පළමු කාර්තුවේදී 2021 වර්ෂයේ නිමකල ව්‍යාපෘතිවලට අදාළ අතැති බිල්පත් ගෙවා අවසන්කොට ඉතිරිවන ශුද්ධ අත ඉතිරි මුදල් 2022 වර්ෂයේ පළමු කාර්තුවේ ව්‍යාපෘති සඳහා යෙදවීමට උපදෙස් ලබා දී තිබූ නමුත් එසේ ක්‍රියා නොකර අතැති බිල් කාර්තු 4 වෙනුවෙන්ම වෙන් කිරීම තුල මතුවන ගැටළු සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.හිඟ බිල්පත් ගෙවා අවසන් කිරීමෙන් පසු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන හා පළාත් සංවර්ධන ප්‍රධාන වලින් ඉතිරිවන ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණය නිවැරදිව ගණනයකර ගැනීමට හැකිවන බවත් , ඒ අනුව ප්‍රමුඛතා ගතකල ව්‍යාපෘතිවලට එම ශුද්ධ අත ඉතිරි මුදල් යෙදවීමට හැකිවන බවත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.ඒ අනුව එම කටයුතු සිදුකල කොන්ත්‍රාත් කරුවන් අපහසුතාවට පත් නොවන අතර එසේ නොකිරීම තුල ඉදිරියේදී ව්‍යාපෘති සිදු කිරීමේදී ගැටළු මතුවිය හැකි බවත් , ඒ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් වරුන්ට වගකීමට සිදුවන බවටත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේක. (මූල්‍ය / සැලසුම්) , |
| 08. | පාසැල් හා කාර්යාල ගෙවතු වගා වැඩසටහන සම්බන්ධව | ගෝලීය වශයෙන් මෙන්ම ශ්‍රී ලංකාවේද පවතින ආහාර හිඟවීමේ ගැටළුවත් සමඟ කාර්යාල මට්ටමේ, පාසැල් මට්ටමේ සිට වගා සංග්‍රාමයකට යාමේ අවශ්‍යතාවක් මතුව ඇත. ඒ අනුව පාසැල් මෙන්ම කාර්යාල ගෙවතු වගාව තුලින් රටට වැඩි ඵලදායීතාවයක් ලබාගත හැකි තත්ත්වයකට වගා කටයුතු සංවිධානයකර පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම පාසැල් හා ආයතන වශයෙන් සකස්කල යුතුය. | |

| | | | |
|---|---|---|---|
| | | මෙවන විටත් අධ්‍යාපන අංශ වෙත එම උපදෙස් ලබා දී ඇති අතර ආයතනික මට්ටමින් ගෙවතු වගා වැඩසටහන සම්බන්ධව දැනුවත් කිරීමට චක්‍රලේඛ ලිපියක් සකස් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | |
| | | කාර්යාල ගෙවතු වගාව සිදු කිරීමට කටයුතු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් ඒ සම්බන්ධව පසු විපරම් කිරීමට කටයුතු කලයුතු බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් පෙන්වා දෙන ලදී.ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් කමිටු පත්කර වගා කටයුතු සම්බන්ධව පසු විපරම් කිරීමට සති දෙකකට වරක් රැස්වී ගැටළු සාකච්ඡා කිරීමටත් සුදුසු බව කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම් විසින් යෝජනා කරන ලදී.එමෙන්ම කෘෂිකර්ම අධ්‍යක්ෂවරු , සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන් හා කෘෂිකර්ම උපදේශක නිලධාරීන් කාර්යාලවල සිට තව දුරටත් රාජකාරී ඉටුකිරීම ප්‍රායෝගික නොවන බවත් ඒ වෙනුවට ක්ෂේත්‍ර රාජකාරීවල නිරතව බිම් මට්ටමේ සිට වගා කරුවන් සදහා උපදෙස් ලබා දීම හා මඟ පෙන්වීමට කටයුතු සිදුකල යුතු බවත් වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ,<br><br>ලේකම් , කෘෂිකර්ම අමාත්‍යාංශය |
| | | කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් අවබෝධයක් නොමැතිව වගා කටයුතු සිදු කිරීමේදී පැන නගින ගැටළු සම්බන්ධව වගා කරුවන්ට එම අවස්ථාවේදීම පිළියමක් නොමැති වන බැවින් පාසැල් මට්ටමින් විදුහල්පති වරුන් හා කෘෂිකර්ම විෂය සම්බන්ධ ගුරුවරුන් වෙත මෙන්ම ඊට අතිරේකව බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ සිටින වගා කටයුතු වෙනුවෙන් උනන්දුවක් දක්වන කණ්ඩායම් වෙනුවෙන් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් දින දෙකක පුහුණුවක් මඟින් ලබා දීමට කටයුතු කරන බව හා වගා කටයුතු සදහා අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය ව්‍යාපෘතියක් ලෙස ලබා දීමට කටයුතු කිරීම සදහා සාකච්ඡා කල බව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.කඩිනමින් මෙම කටයුතු සිදුකර අවසන් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම් , අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | තවද වගා කටයුතු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනද සක්‍රීය ලෙස සම්බන්ධ කරගත යුතු බවත් තම බලප්‍රදේශය තුල වගා නොකරන ලද ඉඩම් හා කුඹුරු සම්බන්ධව වගා කටයුතු ආරම්භ කිරීමට එම පුද්ගලයන්ගේ අවධානය යොමු කරවන ලෙස පළාත් පාලන ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් උපදෙස් ලබා දෙන ලදී. | |
| | | තවද වගාව සදහා අවශ්‍ය බීජ වර්ග , පොහොර හා අනෙකුත් ද්‍රව්‍ය අලවි කිරීම සදහා බස්නාහිර පළාත් සභා සංකීර්ණයේ පළමු මහලේ වෙළඳ කුටියක් පවත්වාගෙන යාමට හා බස්නාහිර පළාත් සභාවට අයත් කොරතොට ප්‍රදේශයේ පිහිටි අක්කර පහක භූමි ප්‍රදේශය වගා කටයුතු සදහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ලබා දීම සුදුසු බවටත් සාකච්ඡා කරන ලදී.ඒ සම්බන්ධව පවතින හැකියාව සොයාබලන ලෙස කෘෂිකර්ම ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී. | ලේකම් , කෘෂිකර්ම අමාත්‍යාංශය, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 09. | 2022 වර්ෂයේදී ආයතන සඳහා කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීම | 2021 වර්ෂයේදී පැවති වසංගත තත්ත්වය හමුවේ කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීමට හැකියාවක් නොමැති විය .එබැවින් 2022 වර්ෂයේදී කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීමට කටයුතු කළයුතු බවට සාකච්ඡා කල අතර ඒ අනුව පළමු පියවර වශයෙන් ආයතන සඳහා කාර්ය සාධන තරඟාවලිය පමණක් පැවැත්වීමටත් එහි ප්‍රගතිය පිළිබඳ සලකා බලා දෙවන පියවර වශයෙන් පුද්ගල කාර්ය සාධන තරඟාවලිය පැවැත්වීම සුදුසු බවට සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) , හා කමිටු සාමාජිකයින් |
| 10. | කාර්යාල කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව | සේවා දායකයන් වෙනුවෙන් සේවා පහසුකම් ලබා දීමට තොරතුරු තාක්ෂණය යොදා ගැනිම දීර්ඝකාලීනව සාකච්ඡා කරන ලද මාතෘකාවක් බව ප්‍රධාන ලේකම් විසින් පැහැදිලි කරන ලදී.නමුත් අනෙකුත් පළාත් සභා වල විවිධ ක්‍රමවේද භාවිතා කරමින් ඉතා දියුණු මට්ටමක තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතා කරන නමුත් බස්නාහිර පළාත් සභාව තුල එය තවමත් ප්‍රාථමික තත්ත්වයක පවතින බව වැඩි දුරටත් කරුණු දක්වන ලදී.ඒ අනුව තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් දැනට සකස් කරමින් පවතින මානව සම්පත් කළමනාකරණ පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. ඒ අනුව නිලධාරීන්ගේ සේවා කටයුතු සම්බන්ධව සියලු තොරතුරු එම තොරතුරු තාක්ෂණ පද්ධතිය යටතේ ක්‍රියාත්මක විය යුතු බවත් ලිපිගොනු හා තොරතුරු තාක්ෂණය යන දෙකම භාවිතා කිරීම තුල තොරතුරු තාක්ෂණය නාමික ක්‍රියාවලියක් පමණක් වන බැවින් තොරතුරු තාක්ෂණය පමණක් මේ සඳහා යොදා ගැනීම ප්‍රායෝගික බවත් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br>තවද තොරතුරු තාක්ෂණය සම්බන්ධ කටයුතු සිදුකරන කණ්ඩායම සතියකට වරක් හෝ රැස්වී පැයක පමණ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන ලෙසත් ,තමාද ඒ සඳහා සහභාගී වන බවත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 11. | නව බඳවාගැනීම් හා උසස්වීම් සිදු කිරීම සම්බන්ධව | නව බඳවා ගැනීම් තාවකාලිකව නතරකර ඇති නමුත් උසස්වීම් සිදු කිරීම බඳවා ගැනීමක් නොවන බැවින් ශ්‍රේණිගත උසස්වීම් සිදුකිරීම ගැටළුවක් නොවන බව සාකච්ඡා කරන ලදී. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

| | | | |
|---|---|---|---|
| **12.** | ව්‍යාපෘති සංශෝධනය සම්බන්ධයෙන් ඉංජිනේරු අංශය වෙත ඉදිරිපත්වන අධික ලියකියවිලි ප්‍රමාණය සම්බන්ධව | එකම ව්‍යාපෘතිය කිහිපවරක් සංශෝධනය වීම නිසා ඒ සම්බන්ධ ලිපි විශාල ප්‍රමාණයක් අමාත්‍යාංශ වලින් ඉදිරිපත් වීම ගැටළුවක් බවත් ඒවා පරීක්ෂා කිරීමට විශාල කාලයක් වැයවන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව **2022** වර්ෂයේදී සියලු ව්‍යාපෘති තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංගය හරහා ඇතුලත් කරන බවත් එබැවින් ඉදිරියේදී එසේ ගැටළුවක් සිදු නොවන බවත් ලිපි ගොණු අධික ප්‍රමාණයක් ඉදිරිපත් වීමට හේතුද ඉදිරිපත් කරමින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>තවද මූල්‍ය අංශය මඟින් ප්‍රතිපාදන නිකුත් කිරීම පිළිබඳ තොරතුරු වෙබ් අඩවියට නිකුත් කරන බවත්, එය කාර්යක්ෂම නොවන බැවින් **Whatsapp** මඟින් එම තොරතුරු යොමු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව එම තොරතුරු වෙබ් අඩවියට මෙන්ම **Whatsapp** මඟින් යොමු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබාදෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු / සැලසුම් /මූල්‍ය) |
| **13.** | මූල්‍ය අංශයේ කරුණු දැක්වීම් සම්බන්ධව | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සියලුම ලේකම්වරුන්ගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් සිදු කරන ලදී.<br>✓ චක්‍රලේඛනානුකූලව **2022.02.28** වන විට භාණ්ඩ සමීක්ෂණය නිමකල යුතුව ඇති අතර, ශාඛා ආයතන වලට **2022.06.30** දක්වා භාණ්ඩ සමීක්ෂණ ඉදිරිපත් කල හැකි බව ප්‍රකාශ කරන ලදී.<br>✓ කොන්ත්‍රාත් සඳහා ඉංජිනේරු නිර්දේශ නොමැති බව පවසා රඳවා ගන්නා ලද වසර දෙක ඉක්මවූ පොදු තැන්පත් පවතින බවත් මේ පිළිබඳ නිතර උපදෙස් ලබා දෙන බවත් ඒ සියල්ල රජයේ ආදායමට ගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>✓ වත්කම් ගිණුම් ගතකිරීම මේ වන විට ආරම්භකර ඇති බවත් , නව ගොඩනැගිල්ලේ වත්කම් ගිණුම්ගත කිරීමේදී ඉංජිනේරු අංශය, පාලන අංශය, මූල්‍ය අංශය,එක්ව එම කටයුතු සිදු කරන ලෙසද උපදෙස් ලබා දෙන ලදී.<br>✓ අමාත්‍යාංශ ලේකම්වරු විසින් තම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සම්බන්ධව **2022.02.28** දිනට පෙර ගිණුම් ඉදිරිපත් කල යුතු බවද දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |

| | | | |
|---|---|---|---|
| | | ✓ මූල්‍ය කටයුතු නිසි පරිදි සිදු නොවීම සම්බන්ධව විවිධ පැමිණිලි පවතින බැවින් පොදු අධීක්ෂණ ක්‍රියාවලියක් සිදු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී.ඒ අනුව සෑම අමාත්‍යාංශයකම ලේකම්වරු , ගණකාධිකාරීවරු සති දෙකකට වරක් හෝ සියලුම නිලධාරීන් පැයක පමණ කාලයකට රැස්කොට අමාත්‍යාංශ ක්‍රියාවලිය, ගිණුම් , පාලන , සංවර්ධන කටයුතු සම්බන්ධව සාකච්ඡාකර ආයතනික අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත්කර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.